# ශ්‍රී ලංකා කර්තෘ සංසදය

# වෘත්තීය ප්‍රතිපත්ති මාලාව

**ශ්‍රී ලංකා කර්තෘ සංසදය විසින් සම්පාදනය කරනු ලැබ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම විසින් පිළිගැනුණු මාධ්‍ය වෘත්තිය ප්‍රතිපත්ති (ආචාර ධර්ම) සංග්‍රහයයි.**

**1. පූර්විකාව**

පුවත්පත් ප්‍රකාශන සමාගම් කර්තෘවරු සහ ඔවුන්ගේ පුවත්පත් කලාවේදීන්/වේදිනියන් මෙන්ම මුද්‍රිත සහ අන්තර්ජාල ලියුම්කරුවන්, කෙරෙහි බලපාන මේ මාධ්‍ය වෘත්තීය ප්‍රතිපත්ති සංග්‍රහය, ශ්‍රී ලංකා මාධ්‍ය නිදහස්ව ද පාඨක අවශ්‍යතා සහ අපේක්ෂා පිළිබඳ වගකීමෙන් හා සංවේදීතාවෙන් යුතුව ද පවත්වා ගැනීමත් ඒ අතරම පුවත්පත් කලාවේ උසස්තම ප්‍රමිති ආරක්ෂා කිරීමත් ද අරමුණු කොට ගත්තකි.

මාධ්‍ය නිදහසට එරෙහිව ක්‍රියාත්මකවන විකෘති වාණිජත්වයෙන් හෝ පටු ආත්මාර්ථයේ අනිසි බලපෑමෙන් ද නිර්බාධකව නිරවද්‍යතාව හා වෘත්තීය අව්‍යාජත්වය උදෙසා දරන ප්‍රයත්නය ද පොදු ජන සුබ සිද්ධිය සඳහා ගවේෂණාත්මක පුවත්පත් කලාවේ උසස්තම සම්ප්‍රදාය සහතික කිරීම ද මේ මාධ්‍ය වෘත්තීය ප්‍රතිපත්ති සංග්‍රහයෙන් ප්‍රයත්න දැරේ. සිය ස්ථිර මත දැරීමේ හා ප්‍රකාශයට පත් කිරීමේ නිදහස පුවත්පතටත්, පුවත්පත් කලාවේදීන්ටත්/වේදිනියන්ටත් හිමි වන අතරම අන්‍යයන්ගේ අදහස් කෙරෙහි නිසි සැලැකිලි දැක්වීමටත් සමාජය කෙරෙහි සිය වගකීම් පිළිබිඹු කිරීමේ උත්සාහයක යෙදීමටත් පුවත්පත් හා පුවත්පත් කලාවේදීහු වගබලා ගත යුත්තෝය.

මේ මාධ්‍ය වෘත්තීය ප්‍රතිපත්ති මාලාව, පුද්ගලයාගේ අයිතිය මෙන්ම කරුණු දැන ගැනීමට පොදු ජනතාවට ඇති අයිතිය ද ආරක්ෂා කරයි. ඒ අයිතිය ප්‍රකාශනයෙන් මෙන්ම හරයෙන් ද සම්පූර්ණයෙන්ම ආරක්ෂා විය යුතු අතරම පුද්ගල අයිතිය කෙරෙහි දැක්වෙන ගෞරවයට අදාලව එහි අන්තර්ගත වගකීම අන්කිසිවකට හිලවු වන තරමට පටු අන්දමින් හෝ පොදුජන සුබසිද්ධිය උදෙසා කැරෙන ප්‍රකාශය වැළැකෙන තරමට පුළුල්ව හෝ නිර්වචනය නොවිය යුත්තේය.

පැමිණිලි විසඳීමේ දී කර්තෘවරුන්/වරියන් පුවත්පත් පැමිණිලි කොමිසම සමග ක්ෂණික සහයෝගිතාවෙන් කටයුතු කළ යුතුය. වෘත්තීය ප්‍රතිපත්ති මාලාව උල්ලංඝනය කර ඇතැයි නිගමනය වන සෑම ප්‍රකාශනයක්ම එම තීන්දුව නිසි ප්‍රමුඛතාවක් හා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ සඳහනක් සහිත සිරස්තලයක් ද ඇතිව පළ කළ යුත්තේය.

**2. නිරවද්‍ය වාර්තාකරණය**

2.1 නිවැරැදිවත් විකෘතියකින් තොරවත් ප්‍රවෘත්ති පළ කිරීම ඡායාරූප හා වෙනත් අනුරූප නිවැරදිව සහ විකෘති කිරීමකින් තොරව පළ කිරීම සඳහා මාධ්‍ය, සාධාරණ පරෙස්සමකින් ක්‍රියා කළ යුත්තේය. සැලකිය යුතු සෑම අනුරූපමය ඩිජිටල් වෙනස් කිරීමකම ඒ බව සඳහන් කළ යුතුය.

2.2 වාර්තාවල නිරවද්‍යතාව, එය පළ කැරෙන්නට කලින් සොයා බැලීම සඳහා කර්තෘවරුත් ඒ ඒ පුවත්පත් කලාවේදියෝත් සෑම සාධාරණ ප්‍රයත්නයක්ම දැරිය යුත්තෝය. එවැනි සොයා බැලීමක් ප්‍රායෝගිකව නොකළ හැකි අවස්ථාවකදී ඒ බව වාර්තාවෙහි සඳහන් කළ යුතුය.

2.3 කර්තෘවරුන්/වරියන්, බාහිර ලේඛකයන්/ලේඛිකාවන් ඇතුළු කාර්ය මණ්ඩලත් අසත්‍ය හෝ නිවැරැදි නොවන බව තමන් දන්නා වූ ද එසේයැයි විශ්වාස කිරීමට තමන්ට හේතු ඇත්තාවූ ද කිසිදු කරුණක් තහවුරු වන අන්දමින් පළ නොකළ යුත්තේය.

2.4 පොදු ජන සුබ සිද්ධිය සඳහා ගවේෂණාත්මක පුවත්පත් කලාවෙහි නියැලෙන ලෙස ප්‍රකාශන දිරිමත් කැරේ.

2.5 විකෘති කිරීම්වලින් වැළකිය යුතුය. සුදුසු පරිදි ජනතාවගේ වෙනත් කටයුතු ආරෝපණය කර දැක්විය යුත්තේ අදාලත්වය අනුවය.

2.6 මාධ්‍ය, අර්ථ නිරූපන, අනුමාන, සහ කරුණු පැහැදිලිව වටහාගත යුතුය.

### 3. නිවැරැදි කිරීම් හා සමා අයැදීම

3.1 වාර්තාවක් කරුණු අතින් වැරැදියැයි කර්තෘට පෙනී යන අවස්ථාවකදී එය නිසි ප්‍රමුඛතාවක් හා යෝග්‍ය වන්නේ නම් සමා අයැදීමක් ද ඇතිව, එම නිවැරැදි කිරීම හා සමා අයැදීම පීඩිත පාර්ශවයේ කැමැත්තට පටහැනි වන අවස්ථාවකදී හැර, අනෙක් හැම විටෙකදීම වහාම නිවැරැදි කළ යුත්තේය.

### 4. පිළිතුරු දීමට අවස්ථා

4.1 කරුණු අතින් සාවද්‍ය ප්‍රකාශන නිසා පුද්ගලයන්ගේ හෝ සංවිධානවල හෝ කීර්තියට ගෞරවයට, නම්බුවට, හැඟීම්වලට පෞද්ගලිකත්වයට හා නිලයට හානි සිදුවන්නේ නම්, ඒ ප්‍රකාශනවලට පිළිතුරු දීම සඳහා සාධාරණ හා යුක්ති සහගත අවස්ථාවක් ඒ පුද්ගලයනට හෝ සංවිධානවලට හෝ දිය යුත්තේය. එම පිළිතුරු සිය කරුණු පැහැදිලි කිරීම සඳහා පැමිණිලිකරු/පැමිණිලිකාරිය කරන ප්‍රකාශයට සීමා විය යුතු අතරම, සිදුවිණැයි කියන වරද නිවැරැදි කිරීම පිණිස අවශ්‍ය ප්‍රමාණයට වඩා එය දීර්ඝ ද නොවිය යුත්තේය.

4.2 වරද ගැන සමාව අයැදීම හෝ කනගාටුව පළ කිරීම වෙනුවට පැමිණිලිකරුගේ/පැමිණිලිකාරියගේ පිළිතුරට ප්‍රතිචාර දක්වන කතුවරු හෝ පුවත්පත් කලාවේදියෝ ඊට පිළිතුරු දීමේ තවත් අවස්ථාවක් අතෘප්ත පාර්ශවයට සලසා දීමට සූදානම් විය යුත්තෝය.

### 5. රහස්‍ය මූලාශ්‍ර

5.1 තොරතුරුවල රහස්‍ය මූලාශ්‍රය, එය අනාවරණය කිරීමේ අවසරය ඒ මූලාශ්‍රයෙන්ම නොලැබෙන තෙක් හෙළිදරවු නොකිරීමේ සදාචාරත්මක වගකීමක් සෑම පුවත්පත් කලාවේදියකුටම/වේදිනියකටම ඇත්තේය.

### 6. පොදු වාර්තාකරණය හා ලිවීම

6.1 කම්පන හෝ හිත් වේදනා ඇති කරන ආකාරයේ සමාජ ප්‍රශ්න, එනම්, කෲරත්වය,ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය අපයෝජනය, දුෂ්ටත්වය,පරපීඩා/කාමුකත්වය, ලිංගික පීඩනය හා අශිෂ්ටත්වයද යනාදිය පිළිබඳ කරුණු වාර්තා කිරීමේ දී ඊට සම්බන්ධ ඡායාරූප හා චිත්‍ර, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්ව ද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය.

6.2 අපරාධ හා අපරාධ නඩු පිළිබඳ තොරතුරු හා වාර්තා කිරීමේ දී ප්‍රකාශන නීතියෙන් හා පොදු ජන යහපත පිළිබඳ සාධකයෙන්ද යන දෙවිදියෙන්ම අවසර ලැබෙතොත් විනා එසේ නොවේ නම්,

I. ලිංගික අපරාධවලට ලක්වූවන්ගේ නම් හෙළිදරවු නොකළ යුතුය.
II. සාපරාධී වරදක් සම්බන්ධයෙන් චෝදනා ලත් වයස අවුරුදු 16 ට අඩු හා පෙර දඬුවම් නැති කිසිදු බාලයකුගේ නම , කරුණු දැන දැනම අනාවරණය නොකළ යුතුය.
III. අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා හෝ දඬුවම් හෝ ලැබූ පුද්ගලයකුගේ ඥතීන්ගේ අනන්‍යතාව ඔවුන්ගේ කැමැත්ත නැතිව හෙළිදරවු නොකළ යුත්තේය.

6.3 පුවත්පත් කලාවේදියෙක් දැන දැනම හෝ හිතාමතා හෝ ජනවාර්ගික හෝ ආගමික අසමගියට හෝ ප්‍රචණ්ඩත්වයට අනුබල නොදිය යුත්තේය.

6.4 I. පුද්ගලයකුගේ වර්ගය, වර්ණය, ආගම හා ලිංගිකත්වය පිළිබඳවත් ශාරීරික හෝ මානසික රෝගාබාධ පිළිබඳවත් අගති සහගත හා අවඥාසහගත කරුණු සඳහන් කිරීමෙන් පුවත්පත් වැළැකිය යුත්තේය.

II.පුද්ගලයකුගේ වර්ගය, කුලය, ආගම, ලිංගික නැඹුරුතා ශාරීරික හෝ මානසික රෝගාබාධ පිළිබඳ විස්තර, කතාවට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළැකිය යුත්තේය.

**6.5** සිය දිවි නසා ගැනීම් වාර්තා කිරීමේදී, ඒ ජීවිත හානිය සඳහා යොදා ගැනුණු උපක්‍රමය පිළිබඳ පමණට වැඩි විස්තර ඉදිරිපත් නොකිරීමට පුවත්පත් කලාවේදියෝ පරෙස්සම් විය යුත්තෝය.

## 7. පෞද්ගලිකත්වය

7.1 පුද්ගලයන්ගේ පෞද්ගලික හා පවුල් ජීවිත ඔවුන්ගේ ගේ-දොර ,සෞඛ්‍යය හා සහසම්බන්ධතා ද සංඛ්‍යාංක සන්නිවේදනය කෙරෙහි ගෞරවයක් දැක්වීමෙහිලා පුවත්පත් විශේෂ සැලැකිල්ලකින් ක්‍රියා කළ යුත්තේය. පෞද්ගලිකත්වයට ඇති මේ අයිතිය අදාල පුද්ගලයන්ගේ කැමැත්තෙන් තොරව ආක්‍රමණය කිරීම සාධාරණීකරණය කළ හැක්කේ පොදුජන සුබ සිද්ධිය ඒ සියල්ල ඉක්මවා යන්නේ නම් පමණකි.

7.2 පෞද්ගලිකත්වය පිළිබඳ සාධාරණ අපේක්ෂාවක් පවත්නා පෞද්ගලික හෝ පොදු තැනක සිටින පුද්ගලයන් ඔවුන්ගේ කැමැත්ත නැතිව ඡායාරූපගත කරනු සඳහා දිගු කාච සහිත හෝ වෙනත් ආකාරයක කැමරා භාවිතය, පොදු යහපත පිණිස නොවන්නේ නම්, එය පිළිගත නොහැක්කේය.

7.3. ශෝකය හෝ කම්පනය හා සම්බන්ධ සිද්ධි පිළිබඳ කරුණු විමසීමේදීත් ඒ සඳහා ඒවාට සමීපවීමේදීත් නිසි සංවේදීතාවෙන් හා ස්ථානෝචිත ප්‍රඥාවෙන් ද කටයුතු කිරීමට පුවත්පත් කලාවේදිහු විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තෝය.

7.4 සිය පාසල් සමය අනවශ්‍ය අත පෙවීම්වලින් තොරව සම්පූර්ණ කර ගන්නට බාලයනට නිදහස තිබිය යුතුය. ළමයකුගේ පෞද්ගලික ජීවිතය හා සම්බන්ධ කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිගත හැකි කාර්යයක් වනු ඇත්තේ ඔහුගේ හෝ ඇගේ පවුලේ හෝ භාරකරුගේ කීර්තිය ප්‍රසිද්ධිය හා තත්ත්වය හැර අනෙක් කරුණක් පොදුජන සුබසිද්ධිය උදෙසා වන්නේ නම් පමණකි.

7.5 පෞද්ලිකත්වය ආක්‍රමණය කිරීමට එරෙහි තහංචි රෝහල්වල හෝ සමාන වෙනත් ආයතනවල හෝ සිටින පුද්ගලයන් පිළිබඳ විමසීම්වලටට විශේෂයෙන් අදාළ වන්නේ එය පොදුජන සුබ සිද්ධිය පිණිස වන්නේ නම් පමණි.

## 8. හිරිහැර හා කපටිකම්

8.1 බිය වැද්දීමෙන් හෝ හිරිහැර කිරීමෙන් හෝ වැරැදි කරුණු ඉදිරිපත් කිරීමෙන් හෝ කපටිකමින් හෝ තොරුතුරු හෝ ඡායාරූප ලබා ගැනීමට ඡායාරූප ශිලපීහු ද ඇතළු පුවත්පත් කලාවේදිහු තැත් නොකළ යුත්තෝය. පොදු ජන යහපත පිළිබඳ සාධකයෙන් සාධාරණීකරණය කළ නොහැකි නම් හා වෙනත් පිළිවෙළකින් තොරතුරු ලබා ගත හැකි නොවිණි නම් දිගු කාච, කැමරා හෝ ශ්‍රවණ උපකරණ, පුද්ගලික අන්තර් නිරෝධනය, ජංගම දුරකථන ඇමතුම්, විද්‍යුත් තැපෑල හෝ පණිවිඩ භාවිත නොකළ යුත්තෝය.

## 9. වෘත්තීය ගෞරවය

9.1 සෑම මාධ්‍යවේදියකුම අවංකත්වය සමඟ කටයුතු කළ යුතුය. සහ ඔවුන්ගේ කාර්යය ඉටු කිරීමේදී ගෞරවය ආරක්ෂා කිරීමට වගබලාගත යුතුය.

9.2 අභිරුචිය පිළිබද ගැටුම් ඇතිවන අවස්ථාවලින් වැළකිය යුතුය. තමා සම්බන්ධ යම් පුවතකට අදාලව සමීප පෞද්ගලික සබඳතා පවතීනම් හෝ තමන්ගේ ගෞරවයට හානිවන අන්දමට ත්‍යාග දීම හෝ ගැනීම හේතුවෙන් කිසියම් ගැටුම්කාරි තත්ත්වයක් වැළැක්විය නොහැකි වන්නේනම්, පුවත්පත්කලාවේදීන්/ වේදිනියන් විසින් ඒ බව තමන්ගේ කර්තෘට හෝ වගකිවයුතු ප්‍රධානියකුට හෝ

දැන්විය යුතුය. එවැනි ගැටුමක් නොවැළැක්විය හැකි නම් එය සාමාන්‍යයෙන් පාඨකයාට අනාවරණය කළ යුතුය.

9.3.i.මේ සඳහා නීති පනවා නොමැති වුවත්, සාමාන්‍යයෙන් ප්‍රකාශයට පත්වීමට ප්‍රථමයෙන් තමන්ට ලැබෙන මූල්‍ය තොරතුරු වලින් තමන්ට ලැබෙන යහපත ගැන නොසලකා පුවත්පත්කලාවේදීන්/වේදිනියන් විසින් එවැනි තොරතුරු අනෙක් අයගේ යහපත සඳහා ලබා නොදිය යුතුය.

ii. පුද්ලගයන් හෝ ඔවුන්ගේ පවුල්වල අය විසින් පවත්වාගෙන යනු ලබන කොටස් හෝ සුරැකුම්පත් හි සැලකිය යුතු මූල්‍ය ප්‍රතිලාභ ඇති බව හිමිකරුට(ප්‍රකාශකයාට), කර්තෘට හෝ මූල්‍ය කර්තෘට දැනුම්දිමකින් තොරව පුවත්පත්කලාවේදීන්/වේදිනියන් ඒ පිළිබඳ ලිවීම නොකළ යුතුය.

9.4: ව්‍යාපාරික හෝ කර්තෘ මණ්ඩල නොවන පාර්ශව මගින් ගෙවීම් හෝ වෙනත් ප්‍රතිලාභ දෙනු ලබන දැන්වීම් ප්‍රචාරණය හෝ ප්‍රවර්ධනය සඳහා ලියා ඇති ලිපි ලේඛනවල ඒ බව පැහැදිලිව සදහන් කළ යුතුය. කර්තෘ මණ්ඩල කාරණා වෙනුවෙන් ගෙවීම් ලැබීම හෝ භාර ගැනිම නොකළ යුතුය.

අර්ථ නිරූපණය

1. 'මහජන යහපත' යනු,

1.i. ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ජනතාව විසින් තෝරාපත්කර ගනු ලැබූ නියෝජිතයින් ගේ සහ රජයේ ක්‍රියාකලාප පිළිබඳව ජනතාව දැනුම්වත්කිරීම.

ii. මතු දැක්වෙන කරුණුද ඇතුළත් වේ. එසේ වුවත් එම කරුණුවලටම සීමා වී නොමැත:

- අපරාධයක් හෝ තර්ජනය කිරිමක් සොයාගැනීම හා හෙළිදරව් කිරීම
- පුද්ගලයකු හෝ සංවිධානයක් නෛතික බැඳීම් වලට අවනත විමට අපොහොසත් විම හෝ අපොහොසත් වනබව පෙනීයාම අනාවරණය කිරීම
- යුක්තිය නොතකාහැරීම් අනාවරණය කිරීම
- තදබල ලෙස නොහොබිනා කටයුතු වල යෙදීම, අචාරධර්ම වලට පටහැනි ලෙස හැසිරීම හෝ ජනතාව සම්බන්ධයෙන් නොහැකියාවෙන් ක්‍රියා කිරීම යන වැදගත් කරුණු සඳහා ප්‍රසිද්ධ විවාද පැවැත්වීම හෝ දායකත්වය ලබාදීම.
- සැඟවී සිටිම හෝ සැඟවි සිටිමට තැත් කිරීම හෝ ඉහත දැක්වෙන ඕනෑම දෙයක්
- මහජන සෞඛ්‍ය සහ සෞඛ්‍යාරක්ෂාව සහ සමාජ, සංස්කෘතික සහ අධ්‍යාපනික සම්මත ආරක්ෂා කිරීම
- පුද්ගලයකු හෝ සංවිධානයක් මගින් යම් ප්‍රකාශනයක් හෝ ක්‍රියාවකින් මහජනතාව නොමග යැවීමෙන් ආරක්ෂා කිරීම

2. කවර තත්ත්වයක් යටතේ වුවද පොදුජන සුබ සිද්ධිය අදාල වන අවස්ථාවකදී එය යථා පරිදි ඉටු වී තිබේද යන වග පැහැදිලිව දක්වන සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කරන ලෙස කතුවරයාගෙන් හා/හෝ පුවත්පත් කලාවේදියාගෙන්/වේදිනියගෙන් ඉල්ලා සිටීමේ අයිතිය පුවත්පත් පැමිණිලි කොමිසමට ඇත්තේය.

**අන්තර්ජාල ප්‍රකාශන**

මෙම වෘත්තීය ප්‍රතිපත්ති මාලාවේ විධිවිධාන පුවත්පතේ අන්තර්ජාල ප්‍රකාශනවලට ද අදාළ වන්නේය.

- පුවත්පතේ, සඟරාවේ හෝ ස්වාධීන වෙබ් ප්‍රකාශනයේ කතුවරයා අවසානයේ දී වගකීම භාරගත යුතු අතර එහි කර්තෘ මණ්ඩල පාලනය සහ ප්‍රකාශයට පත්කිරීමට පෙර වෘත්තීය ප්‍රතිපත්ති මාලාවේ අඩංගු නියමයනට අනුකූල ද යන කරුණු දෙකම ගැන සැළකිලිමත් විය යුත්තේය.

- යොදාගනු ලබන ලිපි ලේඛන පූර්ව සංස්කරණයකට භාජන නොවිය යුතු අතර අන්තර්ජාල මාධ්‍ය හෝ අන්තර්ජාල මාධ්‍ය නොවන වෙනත් මාධ්‍ය නියාමන ආයතන වල සම්මතයනට අනුකූල බවට සහතික විය යුත්තේය.

**සමාලෝචනය**

ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ සාමාජිකයන්ගෙන්/සාමාජිකාවන්ගෙන් හා සංසදය විසින් පත් කැරෙන එහෙත් සංසද සාමාජික නොවන්නන්ගෙන් ද සමන්විත වෘත්තීය ප්‍රතිපත්ති කමිටුවක උපදෙස් ඇතිව, ශ්‍රී ලංකා කර්තෘ සංසදය මෙම වෘත්තීය ප්‍රතිපත්ති මාලාවේ විධිවිධාන වරින් වර සමාලෝචනය කළ යුත්තේය.

පහත දැක්වෙන සංවිධාන මේ ආචාර ධර්ම පද්ධතියට සහයෝගය දැක්වීය.

**පුවත්පත් ප්‍රකාශකයන්ගේ සංගමය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය, ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය, ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලය, ශ්‍රී ලංකා මුස්ලිම් මාධ්‍ය සංසදය , මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය, ශ්‍රී ලංකා ද්‍රවිඩ මාධ්‍ය සංවිධානය, දකුණු ආසියා නිදහස් මාධ්‍ය සංගමය-(ශ්‍රී ලංකා පාර්ශ්වය)**

සංශෝධිත මුද්‍රණය 2015 මැයි